# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**1975 අප්‍රේල් 11, වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(75. 04. 21 දින නිකුත් කරන ලදි)**


# පොල් සංවර්ධන (සංශෝධන)

**1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි තැ. පෙ. අංක 500 දරන රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

3 වන වගන්තිය: පොල් සංවර්ධන පනතෙහි ඇතුළත් කරනු ලබන 63 වන අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම පනතේ විධිවිධාන තල් සහ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන තාල වර්ගයේ වෙනත් ගස්වලට ව්‍යාප්ත කිරීම ය.

1—ඒ13113—7,000 (75/03)

# පොල් සංවර්ධන (සංශෝධන)

එල්.ඩී.—ඕ. 68/73

**1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක      දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. පොල් සංවර්ධන පනතේ 62 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම පනතේ 63 වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 63 වන වගන්තිය ඇතුළත් කිරීම.

"පොල් සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීම් වලට තල් සහ තාල වර්ගයට අයත් වෙනත් ඇතැම් ගස් සම්බන්ධයෙන් සඳහන් කිරීම් ද ඇතුළත් යයි තේරුම් ගත යුතු බව.

63. 20, 22, 23, 30, 44, 45, 46, 48, 49, 50, 51 සහ 62 වන වගන්තිවල පොල් සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමකට, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, තල් සහ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන තාල වර්ගයේ වෙනත් ගස් සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් ද ඇතුළත් යයි තේරුම් ගත යුතු අතර, එකී වගන්තිවල යෙදෙන "පොල් නිෂ්පාදනය", "පොල් වැවිල්ල", "පොල් ගස" සහ "පොල් කර්මාන්තය" යන යෙදුම් ඒ අනුව තේරුම් ගත යුතු ය.".

2—ඒ 13113—7,000 (75/03)